අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112785818
info@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/12/07/02/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2019.04. 09

චක්‍රලේඛ අංක - **19/2019**

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ. වරුන්,
විදුහල්පතිවරුන් වෙත.

**පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත සංශෝධනය කිරීම.**

මාගේ ඉහත සමාංකිත හා 2019.01.29 දිනැති ලිපිය මගින් තාවකාලිත ව අත්හිටුවා ඇති 2018.06.22 දිනැති 26/2018 දරන පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත පහත සංශෝධනවලට යටත් ව මින් ඉදිරියට බලාත්මක කරනු ලැබේ. එසේ ම, 2015.01.29 දිනැති 05/2015 දරන පාසල්වල අවිධිමත් ලෙස මුදල් අය කිරීම තහනම් කිරීම යන චක්‍රලේඛයේ විධිවිධාන තවදුරටත් බලාත්මක වේ.

2. අදාළ සංශෝධන පහත දැක්වෙන අතර ඒ අනුව, කටයුතු කිරීමට වග බලා ගත යුතු ය.

2.1 චක්‍රලේඛයේ 04.(ii) හා (iv) වගන්ති ඉවත් කෙරේ. 04.(ii) වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

මෙතෙක් ක්‍රියාත්මක වූ පාසල් සංවර්ධන කමිටුව පාසල් සංවර්ධන විධායක කමිටුව ලෙස නම් කර ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක කළ යුතු අතර, පාසල් සංවර්ධන සමිතියේ හා ඊට අදාළ කමිටුවල නිලධාරීන්ගේ ධූර කාලය අවසාන වූ විට මාර්ගෝපදේශ අත්පොතෙහි 4.0 පරිදි නව නිලධාරීන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු වේ.

2.2 මාර්ගෝපදේශ අත්පොතෙහි 4.1.3.3 ලෙස නව වගන්තියක් ඇතුළත් කෙරේ.

4.1.3.3 මෙහි දී එක් පවුල් ඒකකයකින් අය කළ යුත්තේ එක් සාමාජික ගාස්තුවක් පමණි.

2.3 මාර්ගෝපදේශ අත්පොතෙහි 4.2.1 (iii) වගන්තියේ "එසේ ම තෝරා ගත හැකි සෑම අවස්ථාවක දී ම ආදි ශිෂ්‍ය නොවන දෙමාපිය සාමාජිකයන් පත් කර ගැනීමට කටයුතු කළ යුතු ය" යන වගන්තිය ඉවත් කර පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ.

"හැකි සෑම අවස්ථාවක දී ම දෙමාපිය නියෝජිතයන්ගෙන් 75%ක් ආදි ශිෂ්‍ය නොවන දෙමාපියන් විය යුතු ය."

2.4 මාර්ගෝපදේශ අත්පොතෙහි 4.2.4.3 වගන්තිය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

පාසල් සංවර්ධන විධායක කමිටු රැස්වීමක ගණපූරණය එහි සාමාජිකයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් (සභාපති හැර) වන අතර යම් කිසි ගැටලුවක් සඳහා තීරණ ගැනීමේ දී ඒකමතික තීරණයක් නොමැති විට පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකගේ එකඟතාවෙන් තීරණ ගනු ලැබිය යුතු ය.

2.5 මාර්ගෝපදේශ අත්පොතෙහි 4.2.5.1 (ඇ) වගන්තිය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

පාසලේ අනුමත වාර්ෂික සැලැස්මට හා වාර්ෂික අය - වැය ලේඛනයට ඇතුළත් කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර එම ව්‍යාපෘති සඳහා පාසල් සංවර්ධන විධායක කමිටු එකඟතාවය සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතු ය.

2.6 මාර්ගෝපදේශ අත්පොතෙහි 4.7 ඡේදයේ පන්ති කව, අනුකමිටු හා ව්‍යාපෘති කමිටු පිහිටුවීම යටතේ වන 4.7.1, 4.7.2, 4.7.3 හා 4.7.4 ඡේද ඉවත් කරනු ලැබේ. ඒ වෙනුවට, පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

4.7 පාසලේ අවශ්‍යතාව පරිදි සිසුන්ගේ අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන කාර්යයන් සඳහා පන්ති භාර ගුරුවරුන් හා දෙමාපියන් අතර අන්තර් සම්බන්ධතාව පවත්වා ගෙන යාමට තාවකාලික ව කමිටු පිහිටුවා ගත හැකි අතර, පත් කර ගනු ලබන කමිටු පිළිබඳ විධිමත් ලේඛන පවත්වා ගත යුතු ය. අදාළ කාර්යය අවසන් වූ වහා ම අදාළ කමිටු අවසන් කළ යුතු ය. පන්ති කව, අනු කමිටු හරහා දෙමාපියන්ගෙන් කිසිදු මුදලක් අය නොකළ යුතු ය. ඒ පිළිබඳ ව විදුහල්පති විසින් වග බලා ගත යුතු ය.

2.7 මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1 (ආ)හි බාහිර අරමුදල් යටතේ වන "S6 දෙමාපියන්ගේ/ සුබ පතන්නන්ගේ/ ආදි ශිෂ්‍ය සංගමයේ පරිත්‍යාග" යන වගන්තිය ඉවත් කර "සුබ පතන්නන්ගේ පරිත්‍යාග" ආදේශ කරනු ලැබේ.

2.8 මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1 (ඇ)හි වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල් යටතේ වන "S7 පාසල් ඉඩම් හා ගොඩනැගිලිවලින් හා වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ගාස්තු" යන වගන්තිය ඉවත් කර "පාසලට අයත් වත්කම්වලින් උපයා ගන්නා ආදායම්" ලෙස ආදේශ කරනු ලැබේ.

2.9 මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1 (ඇ)හි වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල් යටතේ වන " S8 පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයන්ගෙන් ලැබෙන සාමාජික අරමුදල්" යන වගන්තිය ඉවත් කර "පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයන්ගෙන් ලැබෙන සාමාජික අරමුදල් 4.1.3.2 වගන්තියට අනුව අය කළ යුතු ය " ලෙස ආදේශ කරනු ලැබේ.

2.10 මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1 (ඇ)හි වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල් යටතේ වන " S9 පාසලේ විවිධ ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති මඟින් උපයා ගැනීම් (නිදසුන් - අධ්‍යාපන ක්ෂේත්‍ර චාරිකා, ගුරු ව්‍යාපෘති, ශිෂ්‍ය ව්‍යාපෘති, ඇගයීම්, ක්‍රීඩා, විෂය සමගාමී හා අනෙකුත් ක්‍රියාකාරකම් ..... ආදී) " යන වගන්තිය ඉවත් කර " පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ අත්‍යාවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා ලැබීම් " ලෙස ආදේශ කරනු ලැබේ. මෙම ලැබීම් ද පාසල් සංවර්ධන ගිණුමට බැර කර එමඟින්, අදාළ වියදම් සිදු කළ යුතු ය.

2.11 මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1. (ඇ)හි වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල් යටතේ වන සටහනෙහි අංක ii වන " S9 අනුව ලැබෙන ආදායම්වලින් ගුරුවරුන් හා ශිෂ්‍යයන් දිරිගැන්වීමේ ක්‍රමයක් ද පාසල් සංවර්ධන සමිතියට සකස් කරගත හැකි ය." යන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට " S9ට අදාළ ක්‍රියාකාරකම් පාසලේ අනුමත වාර්ෂික සැලැස්මට ඇතුළත් වී තිබිය යුතු අතර ඒ සඳහා පාසල් සංවර්ධන විධායක කමිටු එකඟතාවය සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත

යුතු ය. ව්‍යාපෘතිය නිම වීමෙන් පසු ව අදාළ ප්‍රගති වාර්තාව සියලු ලේඛන සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු ය." යන්න ආදේශ කරනු ලැබේ.

**2.12** මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1. (ඇ)හි වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල් යටතේ ඇති S10 වගන්තිය වන " පාසල් සංවර්ධන සමිතිය විසින් තීරණය කරනු ලබන වෙනත් අරමුදල් " යන්න ඉවත් කර ඒ වෙනුවට 5/2015 චක්‍රලේඛයේ 5 සහ 6 වගන්ති අදාළ කර ගත යුතු ය.

**2.13** මාර්ගෝපදේශ අත්පොතෙහි 7.1. (ඇ)හි වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල්හි සටහන iii ඉවත් කෙරේ.

**2.14** මාර්ගෝපදේශ අත්පොතෙහි 7.2 ඡේදය ඉවත් කරනු ලැබේ. ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

" ඉහත සඳහන් ප්‍රභව හරහා ප්‍රතිපාදන සලසා ගැනීමේ දී දෙමාපියන්ට කිසිදු අනිවාර්ය කිරීමක් හෝ බල කිරීමක් නොකළ යුතු අතර ලැබෙන මුදල් සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය සහිත ලදු පතක් නිකුත් කළ යුතු ය. ඉහතින් සඳහන් කරන ලද සියලු අරමුදල් ප්‍රභව පාසල තුළ ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝගී කර ගැනීමේ දී රාජ්‍ය මුදල් රෙගුලාසි හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්/ පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් පනවා ඇති රෙගුලාසි, චක්‍රලේඛ උපදෙස් හා පාසල් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ක්‍රියා කළ යුතු ය. ඊට අමතර ව ශිෂ්‍යයන්ගෙන්, දෙමව්පියන්ගෙන් හෝ වෙනත් බාහිර සංවිධානවලින් මුදල් හා ආධාර රැස්කිරීම නොකළ යුතු ය.

**2.15** මාර්ගෝපදේශ අත්පොතෙහි 9.6 වගන්තිය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

" සෑම වසරක ම අගෝස්තු මස අවසන් වීමට පෙර, එළඹෙන වර්ෂයේ අය - වැය ලේඛනය ද ඇතුළත් වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කොට, සෑම වර්ෂයක ම නොවැම්බර් 15ට පෙර විශේෂ පාසල් සංවර්ධන සමිති මහා සභා රැස්වීමක් කැඳවා, එහි දී සම්මත කොට, නොවැම්බර් 30ට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය /පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර 5/2015 චක්‍රලේඛයේ 7 වගන්තිය ප්‍රකාර ව අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කළ යුතු ය. "

**2.16** මාර්ගෝපදේශ අත්පොතෙහි 9.8 වගන්තිය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අනුමත ක්‍රියාකාරකමක් සඳහා එම ක්‍රියාකාරකමින් අපේක්ෂිත අරමුණු සපුරා ගැනීමට යම් වැය විෂයයක මුදල් ප්‍රමාණවත් නොවුණහොත් මුදල් ඉතිරි වේ යයි අපේක්ෂිත (එම වැය විෂයයේ අරමුණ ඉටු වී ඇති නම් පමණක්) වෙනත් වැය විෂයයකින් මුදල් මාරු කර ගැනීම පහත සඳහන් පරිදි පාසල් සංවර්ධන විධායක කමිටු අනුමැතියෙන් සිදු කළ හැක.

(අ) පුනරාවර්තන වැය විෂයයක ඉතිරි වීමක් පුනරාවර්තන වැය විෂයකට මුදල් මාරු කර ගත හැකි ය.

(ආ) පුනරාවර්තන වැය විෂයයක ඉතිරි වීමක් ප්‍රාග්ධන වැය විෂයකට මුදල් මාරු කර ගත හැකි ය.

(ඇ) ප්‍රාග්ධන වැය විෂයයක ඉතිරි වීමක් ප්‍රාග්ධන වැය විෂයකට මුදල් මාරු කර ගත හැකි ය.

(ඇ) ප්‍රාග්ධන වැය විෂයයක ඉතිරි වීමක් පුනරාවර්තන වැය විෂයකට මුදල් මාරු කර ගත නොහැකි ය.

**2.17** මාර්ගෝපදේශ අත්පොතෙහි "වැය ශීර්ෂය" යනුවෙන් සඳහන් සෑම ස්ථානයක ම එය "වැය විෂයය" ලෙස ආදේශ කරනු ලැබේ.

**2.18** මාර්ගෝපදේශ අත්පොතෙහි 10.2 වගන්තිය ඉවත් කර පහත ඡේද ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ.

10.2 (අ) විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජයෙන් ලබා දුන් අරමුදල් හැර, පාසල් සංවර්ධන සමිතිය විසින් විශේෂිත කාර්යයක් සඳහා උපයා ගෙන ඇති අරමුදල් එම වර්ෂය තුළ ම වියදම් කළ යුතු අතර යම් විශේෂිත හේතුවක් මත එම කාර්යය සඳහා වියදම් කිරීමට අපොහොසත් වුවහොත්, එම අපේක්ෂිත කාර්යය ඉටු කර ගන්නා තෙක් පාසල් සංවර්ධන විධායක කමිටුවේ එකඟතාවය මත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිත ව කෙටි කාලීන ව මාස 03 ක උපරිමයකට යටත් ව, රාජ්‍ය බැංකුවක ආයෝජනය කළ හැකි ය. ආයෝජන පිළිබඳ විස්තර ඇතුළත් ඇමුණුම් අංක 23 පරිදි ස්ථාවර තැන්පතු ලේඛනයක් පවත්වා ගෙන යා යුතු ය.

10.2 (ආ) දැනට පාසල් සතු ව පවත්නා වසරකට වඩා පැරණි ස්ථාවර තැන්පතුවල මුදල් පාසලේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා පාසල් සංවර්ධන විධායක කමිටුවේ නිර්දේශ මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ /පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
3. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
4. ලේකම්, මුදල් කොමිෂන් සභාව
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
6. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
7. ප්‍රධාන මූල්‍ය නිලධාරි, අධ්‍යාපන අමාත්‍යාංශය
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය
9. සියලු ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය